---

**බේරුවල නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

----------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 03 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව බේරුවල නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිස ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 6,793,321 ක් වූ ගිණුම් ශේෂ 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,057,067 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.496,998 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 3,537 | 1,875 | 7,824 |
| (ii.) | බදු කුලී | 9,491 | 8,607 | 1,836 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 208 | 271 | 98 |
| (iv.) | වෙනත් ආදායම් | 1,810 | 2,668 | (858) |

2:2:2 වරිපනම් බදු

2012 ඔක්තෝබර් 31 දිනට රු.8,372,862 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් අවුරුදු 5 ඉක්මවූ රු.10,000 කට වඩා වැඩි වරිපනම් දේපල 77 කින් රු.942,520 ක් අය වීමට තිබුණි. නගර සභා ආඥා පනතේ 170(අ)(1) හා (2) වගන්ති අනුව හිඟ වරිපනම් බදු අය කර ගැනීම සඳහා දේපල තහනම් කිරීම් කර නොතිබුණි.

2:2:3 බදු කුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ඔක්තෝබර් 31 දිනට වෙළඳ ස්ථානීය කුලී රු.1,634,344 ක් හිඟව පැවති අතර මෙම මුදල් අයකර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු කඩ කාමර 189 න් කඩ කාමර 164 ක් සඳහා 2011 වර්ෂයේදී කඩ කුලී සංශෝධනයක් සිදු කර බදු දී තිබුණද විගණිත දිනය වූ 2012 නොවැම්බර් 30 වන විටත් නව ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) රු.334,795 ක් වූ හිඟ කඩ කුලී පැවති ව්‍යාපාරිකයින් 5 දෙනෙකුගෙන් කඩ ආපසු පවරා ගෙන වෙනත් අයට බදු දී තිබුණද, එම හිඟ මුදල් 2012 ඔක්තෝබර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ මස් කඩ කුලී රු.579,977 ක 2012 ඔක්තෝබර් 31 වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.3.1 කංකානම්ගොඩ අතුරු මාර්ගය තාර දැමීම

සභා අරමුදල් මගින් සෘජු ශ්‍රම පදනම යටතේ රු.44,419 ක වියදමින් අඩි 94 1/2 ක් දිග වූ ඉහත මාර්ගය තාර දැමීම සිදු කර තිබුණි.

මෙම මාර්ගය සභාවට පවරා ගෙන නොතිබූ අතර 2012 ජනවාරි 24 උන වැඩ අවසන් කර තිබූ මාර්ගය අඩි 94 1/2 ක් දිගටම මාර්ගය දෙපස අඩියක පමණ පළලින් ජල නල එළීම සඳහා පළුදු කර තිබෙණු 2012 නොවැම්බර් 28 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

2.3.2 සභාපති මාවත

සභාපති මාවත දෙපස අඩි 622 ක් දිගට කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් රු.1,971,331 ක ඇස්තමේන්තුවක් සඳහා 2012 සැප්තැම්බර් 13 දින ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත්තුව පිරි නමා තිබුණි.

(අ) මි.මී. 15 ක් ඝණකම වූ ෆලයිවුඩ් ෂටර්මක් ගසා පතුල සහිතව කාණු පද්ධතිය දෙපස 1:2:4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් දැමීමට පිළිවෙලින් රු.494,550 ක් හා රු.576,378 ක් ගෙවා තිබුණි. ෂටර්ම ගසා කොන්ක්‍රීට් දැමීම නිසි ප්‍රමිතියකට සිදු වී නොතිබූ බව 2012 නොවැම්බර් 28 දින සභාවේ කාර්මික නිලධාරිණිය සමඟ සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) කාණුව ඉදි කරන අවස්ථාවේදී මාර්ගය දෙපස පදිංචිකරුවන්ගේ ගෙවතුවල ජලය කාණුවට ගලා එන ලෙස බට යෙදීමට අදාල නිලධාරීන් කටයුතු නොකිරීම හේතුවෙන් කාණු බිත්තිය ස්ථාන 10 කදී විෂ්කම්භය අඩියක පමණ බැගින් වූ පළුදු කිරීම් සදු කිරීම හේතුවෙන් කම්බි මතුවී මල කැමට ලක් වී තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ජර්මන් පරිත්‍යාගයක් යටතේ 2012 පෙබරවාරි මාසයේදී පෙර පාසලක් සඳහා සභාවට පවරා දී තිබූ ගොඩනැගිල්ලෙහි වටිනාකම තක්සේරු කර පරිත්‍යාග ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර 2012 වර්ෂය තුළ මිලදී ගෙන තිබූ රු.322,539 ක් වූ භාණ්ඩ වර්ග 11 ක් යටතේ අයිතම 19 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

2.5 වාහන අළුත්වැඩියාව

(අ) රු.1,912,800 ක් වැය කර සභාව සතු කැබ් රථයක එන්ජිම, බොඩිය යනාදී උපාංග අළුතින් දමා අළුත්වැඩියා කර තිබූ අතර අළුත්වැඩියාවෙන් පසුව වාහනය සඳහා අළුතින් අංකයක් ලබාගෙන නොතිබුණි.

(ආ) පැරණි අංකය යටතේම 2011 හා 2012 වර්ෂ සඳහා රු.98,997 කට රක්ෂණය කර තිබීමෙන් යම් අනතුරකදී අලාභහානි අයකර ගැනීමේ ගැටළු ඇති විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඇ) වාහනයේ තිබී ඉවත් කර තිබූ එන්ජිම හා වාහන බොඩිය 2011 ජුනි 01 දින ගබඩාවට ලැබී තිබූ නමුත් එය 2012 නොවැම්බර් මාසයේ විගණන අවස්ථාව වන විටත් එළිමහනේ මලකඩ කමින් දිරාපත් වෙමින් තිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128, 132, 134 සහ පළාත් පාලන කොමසාරිස්ගේ 2008 අගෝස්තු 19 දිනැති අංක WP/LGD/10/2008 දරන චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය